*සැ. යු.* - 2024.10.25 දින පළ කරන ලද අංක 2408 ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,409 - 2024 නොවැම්බර් මස 01 වැනි සිකුරාදා - 2024.11.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු .... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බදුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1200 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1206 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**
**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 නොවැම්බර් 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 නොවැම්බර් 08 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව

වර්ෂ 2025 වැඩසටහන් අයවැය ලේඛනය

මහ නගර සභා ආඥාපනතේ (252 වන අධිකාරියේ) 212 ඡේදය ප්‍රකාර, දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවේ 2025 වර්ෂය සඳහා වූ වැඩසටහන් අයවැය ලේඛනය 2024 වර්ෂයේ නොවැම්බර් මස 04 වැනි දින සිට නොවැම්බර් මස 12 වැනි දින දක්වා කාර්යාලීය වේලාව තුළ දී නාගරික කොමසාරිස් කාර්යාලයේ මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,
නාගරික කොමසාරිස් හා බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

2024 නොවැම්බර් මස 01 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.

11-08

---

## ගාල්ල මහා නගර සභාව

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

මහ නගර සභා ආඥාපනතේ 286(අ) වගන්තිය පරිදි නාගරික කොමසාරිස්වන මා වෙත පැවරුන බලතල පරිදි මාගේ 2024.09.19 දිනැති තීරණ අංක 2024/09/19/3220 ට අනුව පහත දැක්වෙන යෝජනා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. 2025 වර්ෂය සඳහා පනවන ලද වරිපනම් බදු මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

02. 2025 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බදු 2025 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහය (10%) ක වට්ටමක් ද එක් එක් කාර්තුවට අදාළ වරිපනම් බදු ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දින හෝ එදිනට පෙර ගාල්ල මහා නගර සභාවට ගෙවනු ලැබුවහොත් ඒ එක් එක් කාර්තුවේ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට පහ (5%) ක වට්ටමක් ද ගෙවනු ලැබේ.

03. ඉහත සඳහන් කාල සීමාව තුළ දී වරිපනම් බදු නොගෙව අදාළ මුඩු ඉඩම් හා වාසස්ථාන වෙනුවෙන් සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තුවක් ද , මුඩු ඉඩම් හා වාසස්ථාන නොවන අනෙකුත් දේපළ වෙනුවෙන් සියයට විස්ස (20%) ක වරෙන්තු ගාස්තුවක් ද අයකරනු ලැබේ.

ආර්. එම්. ටී. කේ. රත්නායක
නාගරික කොමසාරිස් , ප්‍රධාන විධායක නිලධාරී,
ගාල්ල මහා නගර සභාව.

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
ගාල්ල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"(252 වැනි අධිකාරිය වූ මහා නගර සභා ආඥාපනතේ 238 වැනි වගන්තිය (1) වැනි උපවගන්තියෙන් මහා නගර සභාව වෙත කරන ලද නියමය ප්‍රකාර, ගාල්ල මහා නගර සභා බල ප්‍රදේශ ඇතුළත පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා කවර වූ හෝ ගෙවල්වල වාර්ෂික තක්සේරු වටිනාකම වශයෙන් 2024 වර්ෂය සඳහා පිළිගෙන තිබූ වාර්ෂික තක්සේරු වටිනාකම 2025 වර්ෂය සඳහා තක්සේරු වටිනාකම වශයෙන් පිළිගැනීමටත්,

එකී, මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ගාල්ල මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වාර්ෂික වටිනාකමින්,

(අ) නේවාසික ස්ථාන මත සියයට හත (7%) ක වරිපනමක් ද සහ
(ආ) වෙළෙඳ හෝ වානිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථාන මත සියයට දොළහ (12) ක වරිපනමක්ද
(ඇ) අනෙකුත් සියලුම රජයේ දේපළ හිස් ඉඩම් සඳහා සියයට විසිදෙක (22%) ක වරිපනමක් ද 2025 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් සහ

ඒ වරිපනම් එකී මහා නගර සභා ආඥාපනතේ 230 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන් වන එක් එක් කාර්තුව අවසන් වීමට පෙර සමාන වාරික හතරකින් ගාල්ල මහා නගර සභාවට ගෙවීමට විධාන කිරීමටත් ගාල්ල මහා නගර සභාව යෝජනා කරන්නීය."

11-10

---

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂයේ අයවැය කෙටුම්පත

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2024 නොවැම්බර් මස 01 වැනි දින සිට 2024 නොවැම්බර් මස 13 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10.2 (ආ) රීතියේ ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඩබ්. ඩී. ලූෂන්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
වෙන්නප්පුව.

2024 ඔක්තෝබර් මස 22 වැනි දින,
ප්‍රාදේශීය සභා කාර්යාලය,
වෙන්නප්පුව.

11-24

---

**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා වූ කෙටුම්පත් කරන ලද අයවැය ලේඛනය 2024.11.04 - 2024.11.12 දින තෙක් (රජයේ නිවාඩු දින සහ ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීතිවල 10.2(ආ) රිති ප්‍රකාරව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. නිරෝෂා හේරත්,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව,
ඉබ්බාගමුව.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා කාර්යාලය,
ඉබ්බාගමුව.

11-111

**රිදීගම ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂයේ රිදීගම ප්‍රාදේශීය සභාවේ කෙටුම්පත් අයවැය ලේඛනය පහත සඳහන් ස්ථානවල දී පරීක්ෂා කර බැලීමට මහජනතාවට අවස්ථාව සලසා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 01. | ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය | - | රිදීගම |
| 02. | ප්‍රාදේශීය සභා උප කාර්යාලය | - | දොඩම්ගස්ලන්ද/හේවාවිස්ස |
| 03. | මහජන පුස්තකාලය | - | දොඩම්ගස්ලන්ද/රඹඩගල්ල/හේවාවිස්ස/රිදීගම |

ලේකම්,
රිදීගම ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 21 වැනි දින.

11-28

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂයේ කෙටුම්පත් අයවැය ලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත සමග කියවිය යුතු වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.10.29 වැනි දින අංක 2199/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන්නට කටයුතු කරන ලද ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති අංක 10(2) (ආ) ප්‍රකාරව වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් 2025 වර්ෂය සඳහා සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය 2024.10.25 දින සිට වාරියපොල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී කාර්යාලීය වේලාව තුළ මහජනතාව වෙත පරීක්ෂාකර බැලීමට ඉඩකඩ සලසා ඇති බව මෙයින් දැනුම් දෙමි.

ලේකම්,
එල්. එම්. සී. එස්. එන්. කේ. ගලබඩගම,
ප්‍රාදේශීය සභාව,
වාරියපොල.

2024 ඔක්තෝබර් මස 21 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

11-29

---

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**

ගෝසාතක ස්ථාන සම්බන්ධයෙන් වූ විරෝධතා කැඳවීමේ දැන්වීම

කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි 91D, උණගස්වෙල ග්‍රාමසේවා වසමේ කරන්දෙණිය, පනාපිටිය, අංක 96/ A යන ස්ථානය 2025 වර්ෂයට අදාළ ගෝසාතක ස්ථානයක් ලෙස භාවිතා කිරීම සඳහා එකී ලිපිනයේ පදිංචි එම්. එම්. එම්. හයිරාස් නමැති අය මා වෙතින් ඉල්ලුම්කර ඇති බැවින් එකී ස්ථානයේ ගෝසාතක ව්‍යාපාරයක් හා මාංශ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් දක්වන කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු සිටී නම් මෙම නිවේදනය ප්‍රකාශයට පත් වූ දින සිට දින 30ක් ඇතුළත එකී විරෝධතාවයට හේතුවන කරුණු ඇතුළත් ලිඛිත ප්‍රකාශනයක් පිටපත් දෙකකින් යුතුව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය ප්‍රකාරව කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය පැවරී ඇති, ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙත ලැබීමට සලස්වන මෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 102 වැනි වගන්තියද සමග කියවිය යුතු ගෝසාතක ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

ඒ. එච්. රවීන්ද්‍ර ලසන්ත මයා.
ලේකම්,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,

11-30

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

වැඩසටහන් අයවැය ලේඛනය -2025 වර්ෂය

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2024 ඔක්තෝබර් 30 දින සිට නොවැම්බර් 08 දින තෙක් (රජයේ නිවාඩු දින, සෙනසුරාදා හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ බිංගිරිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී මහජනාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය බලාත්මක කිරීමේ රීතිවල 10:2(ආ) රීතිය ප්‍රකාරව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. ඒ. නිශාන් ලක්මාල්,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
බිංගිරිය.

2024 ඔක්තෝබර් මස 18 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභාව,
බෝවත්ත.

11-31

---

**මොරටුව මහා නගර සභාව**

2025 වර්ෂයට අදාළව වරිපනම් බදු පැනවීම

මොරටුව මහා නගර සභාව් බලතල ක්‍රියාත්මක කරන, කාර්යය හා කර්තව්‍ය ඉටුකරන මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් එල්. පී. මනෝජා එස්. පතිරණ වන මම මහා නගර සභා ආඥාපනතේ 286අ වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 230 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

මහා නගර සභා ආඥාපනතේ 238 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂිකව වටිනාකම සඳහා 2024 වර්ෂය සඳහා වූ තක්සේරුව 2025 වර්ෂය සඳහා වූ තක්සේරුව ලෙස සම්මත කළ යුතු බවටත්, එකී තක්සේරුව මත මහා නගර සභා ආඥාපනතේ 286අ වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 230(1) වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් පහත දැක්වෙන පරිදි වරිපනම් බද්දක් නියම වියයුතු බවටත්,

01. නේවාසික ස්ථාන සඳහා එම දේපළවල වාර්ෂික වටිනාමින් 8.0%

02. හිස් ඉඩම් සහ පදිංචි නොමැති තනාගෙන යන ගොඩනැගිලි රාජ්‍ය දේපළ හා වෙළෙඳ හෝ වානිජ කාර්යය සඳහා භාවිතා කරනු ලබන ස්ථාන මත එම දේපළ වල වාර්ෂික වටිනාකමින් 20.0% ක් අය කරනු ලැබේ.

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද මොරටුව මහා නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල මොරටුව මහා නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවක අදාළ මුදලින් 5% ක වට්ටමක් ද මොරටුව මහා නගර සභාව මගින් ලබාදිය යුතු බව 2024.10.11 වැනි දින කළමනාකරණ කමිටුවේ තීරණ අංක MMC/RPPDF/D/2024/119-06 යටතේ අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එල්. පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස්,
බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2024 ඔක්තෝබර් මස 22 වැනි දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු කාර්තුව | 2025 ජනවාරි 01 සිට 31 දක්වා | 2025 ජනවාරි 31 |
| දෙවන කාර්තුව | 2025 අප්‍රේල් 01 සිට 30 දක්වා | 2025 අප්‍රේල් 30 |
| තුන්වන කාර්තුව | 2025 ජූලි 01 සිට 31 දක්වා | 2025 ජූලි 31 |
| හතරවන කාර්තුව | 2025 ඔක්තෝබර් 01 සිට 31 දක්වා | 2025 ඔක්තෝබර් 31 |

එම වරිපනම් බද්ද කාර්තුවක් තුළ ගෙවීම පැහැර හරින්නේ නම් නේවාසික දේපළ සඳහා 15% ක දඩ මුදලක් හා හිස් ඉඩම් සහ පදිංචි නොමැති තනාගෙන යන ගොඩනැගිලි හා වානිජ දේපළ සඳහා 20% ක දඩ මුදලක් අය කරනු ලැබේ.

11-34

---

**ආණමඩුව ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය - ගෝ ඝාතකාගාරය සඳහා විරෝධතා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9 වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව ආණමඩුව ප්‍රදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය හා කර්තව්‍ය ඉටුකරන, ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර වන මම, එකී පනතේ 102 වගන්තියේ සහ 272 වැනි අධිකාරය වූ ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඩයන්දළුව, ආඬිගම යන ලිපිනයෙහි පදිංචි මොහම්මදු අනිවු නස්ලිම් යන අය විසින් එකී කඩයන්දළුව, ආඬිගම යන ස්ථානයෙහි ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම සඳහා මාගෙන් අවසර ඉල්ලා සිටින හෙයින් ඒ සම්බන්ධව යම් විරෝධතාවයක් ඇත්නම් 2024.11.22 දිනට ප්‍රථම ආණමඩුව ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව භාර දීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිවේදනය කරමි.

එච්. ජේ. එම්. එම්. එස්. ජයසුන්දර,
ලේකම්, බලතල ක්‍රියාත්මක කරන කාර්යය,
කර්තව්‍ය ඉටු කරන නිලධාරි,
ආණමඩුව ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
ආණමඩුව ප්‍රාදේශීය සභාවේ දී ය.

11-41

---

**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා වන කෙටුම්පත් අයවැය ලේඛනය පරීක්ෂාකර බැලීම වෙනුවෙන්
මහජනතාව වෙත කරනු ලබන දැනුම් දීමයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතට අනුගතව හා 2020 අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව පිළියෙල කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය 2024.11.01 දින සිට 2024.11.12 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 3.00 දක්වා ප්‍රදේශයේ මහජනතාවට පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

එස්. එම්. එන්. කේ. ගුණතිලක,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල
කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව,
බෝහිංගමුව.

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,

11-78

## මාවතගම ප්‍රාදේශීය සභාව

2025 වර්ෂයේ අයවැය කෙටුම්පත

මාවතගම ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2024 ඔක්තෝබර් 30 වැනි දින සිට 2024 නොවැම්බර් 08 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සහ මාවතගම මහජන පුස්තකාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10.2(ආ) රීතිය ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. ටී. කේ. රත්නායක,
ලේකම්,
මාවතගම ප්‍රාදේශීය සභාව.

2024 ඔක්තෝබර් මස 29 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය සභා කාර්යාලය,
මාවතගම

11-107

---

## කුලියාපිටිය නගර සභාව

වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020 ඔක්තෝබර් මස 29 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද 2020 නගර සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීති වල 10(2)(ආ) වගන්තිය අනුව කරනු ලබන දැනුම් දීමයි.

කුලියාපිටිය නගර සභාව සඳහා 2025 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද කෙටුම්පත් අයවැය ලේඛනය මහජනතාවට පරීක්ෂා කර බැලීම 2024.11.04 දින සිට 2024.11.12 දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා නගර සභා කාර්යාලයේ දී සිදු කළ හැකි බව මෙයින් දන්වා සිටිමි.

එස්. එම්. එම්. ඩී. සේනානායක,
ලේකම්,
කුලියාපිටිය නගර සභාව.

දුරකථන අංක : 037-4947798/037-2281275
ෆැක්ස් : 037-2281114
විද්‍යුත් ලිපිනය : Kuliyauc@gmail.com
වෙබ් අඩවිය : Kuliyapitiya.uc..gov.lk

11-106

---

## හලාවත නගර සභාව

2025 වර්ෂයේ අයවැය කෙටුම්පත

හලාවත නගර සභාවේ 2025 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2024 නොවැම්බර් 05 වැනි දින සිට නොවැම්බර් 13 වැනි දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා හැර) කාර්යාල වේලාව තුළ හලාවත නගර සභා කාර්යාලයේ දී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව නගර සභා අයවැය සම්පාදන හා බලාත්මක කිරීමේ රීතිවල 10.2(ආ) රීතිය ප්‍රකාර මහජනතාව වෙත මෙයි නිවේදනය කරමි.

එම්. ඒ. එස්. එස්. මාරසිංහ,
ලේකම්,
හලාවත නගර සභාව.

2024 ක් වූ ඔක්තෝබර් මස 28 වැනි දින,
හලාවත නගර සභා කාර්යාලය,
හලාවත.

11-101

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව

2025 අයවැය ලේඛනය

**මහ නගර සභා ආඥාපනතේ (252) වන අධිකාරය 212 (ආ) වන ඡේදය යටතේ කෙරෙන දැන්වීමයි**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ 2025 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය මහජන ප්‍රදර්ශනය සඳහා කාර්යාල වේලාවන් තුළ 2024 නොවැම්බර් මස 01 වැනි දින සිට මහනගර සභා කාර්යාලයේ තබා ඇති බව මෙයින් දැනුම් දෙමි.

නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව,
රාජගිරිය.

2024 නොවැම්බර් මස 01 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව,
රාජගිරිය.

11-100

# විවිධ දැන්වීම්

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 හා 149 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, 2019.12.05 දිනැති 2152/45 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති මහජන සෞඛ්‍යයට අදාළ අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුව 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 28 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න,<br>ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය<br>ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 28 වැනි දින,<br>බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,<br>දිගදූර.

**තීරණය**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 හා 149 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, 2019.12.05 දිනැති 2152/45 *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති මහජන සෞඛ්‍යයට අදාළ අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුව 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 හා 149 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, 2019.12.05 දිනැති 2152/45 *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති මහජන සෞඛ්‍යයට අදාළ අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුව I වන උපලේඛනයෙහි නිරූපිත යම් කාර්යයක් සඳහා බළන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2025 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් II වැනි උපලේඛනයේ I වැනි තීරුවේ යම් විෂයාංකයක වාර්ෂික වටිනාකම මත II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් අය කිරීමට මම තීරණය කරමි.

### I වන උපලේඛනය

**අප්‍රසන්න ව්‍යාපාර**

| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යය* |
|---|---|
| 01 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම |
| 02 | ලුණුදෙහි නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 03 | බයිට් නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 04 | රස කැවිලි නිපදවා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 05 | පශු වෛද්‍ය සායන පවත්වාගෙන යාම |
| 06 | හඳුන්කූරු නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 07 | පලතුරු බීම හා අයිස් පැකට් නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 08 | පැණි හකුරු නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 09 | පානීය ජලය බෝතල් කර නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 10 | උම්බලකඩ පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 11 | කරවල පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 12 | සිල්ලර වෙළෙඳාම |

අන්තරාදායක ව්‍යාපාර :

| | |
|---|---|
| 01 | නිවාස වයරින් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 02 | කුෂන් වැඩ කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 03 | හිස් ගෝනි, බෝතල්, අබලි ද්‍රව්‍ය, ටින්, ලෝහ රැස් කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 04 | තාර පෙරමුසු නිපැයුම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 05 | ඡායා පිටපත් ලබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 06 | උකස්කරුවන් |
| 07 | ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 08 | ශබ්දවාහිනී ක්‍රියාකරවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |

අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :

| | |
|---|---|
| 01 | ඉන්ජෙක්ටර් පොම්ප අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 02 | රේඩියේටර් අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 03 | වී ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 04 | සත්ත්ව ගෙවිපළවල් පවත්වාගෙන යාම |
| 05 | කෙයොලින් මැටි, කැල්සයිට්, ඩොලමයිට් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 06 | කැල්සියම් කාබනේට් අවක්ශේපනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 07 | තිරුවානා ගල් කැඩීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 08 | කැල්සයිට්, ඩොලමයිට්, ෆෙල්ඩ්පාර් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 09 | තිරුවානා, ඩොලමයිට් පිළිස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 10 | මනාලියන් හැඩ ගැන්වීමේ හා රූපලාවන්‍ය කටයුතු සිදු කිරීම |
| 11 | කෘතිම දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම |
| 12 | බටහිර ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 13 | ආයුර්වේද ඖෂධ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 14 | එළවළු, පළතුරු විජලනය කර ඇසුරුම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 15 | වෛද්‍ය මධ්‍යස්ථාන |
| 16 | බාබර් සාප්පු |

## II වන උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 500.00 |
| රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1,500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 |
| රු. 1500.00 ඉක්මවන අවස්ථාවක | රු. 1000.00 |

11 - 25/1

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, ව්‍යාපාර බදු නියම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 28 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 28 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

### තීරණය

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 152(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන් 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 152 වන (1) වගන්තිය යටතේ බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා වෙත පැවරී බලතල ප්‍රකාර එකී පනතේ හෝ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එම පනතේ 152 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2025 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම මෙහි පහත I වන උපලේඛනයෙහි සඳහන් කාර්යයන් සඳහා II වන උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

### I වන උපලේඛනය

| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යය* |
|---|---|
| 01 | ජංගම අලෙවිසැල් |
| 02 | මත්පැන් අලෙවිසැල් |
| 03 | බැංකු |
| 04 | පුද්ගලික අධ්‍යාපන ආයතන |
| 05 | සම්ප්‍රේෂණ කුළුණු |
| 06 | මිනි කෝප් සිටි |
| 07 | සමුපකාර ප්‍රාදේශිකය |
| 08 | රථවාහන කුළියට දීම |
| 09 | යන්ත්‍ර සූත්‍ර කුලියට දීම |
| 10 | අලෙවි නියෝජිත ආයතන |
| 11 | වාහන අලෙවිසැලක් පවත්වාගෙන යාම |

| *අනු. අංකය* | *බලය දෙනු ලබන කාර්යය* |
|---|---|
| 12 | බෙල් පෙපර් නිෂ්පාදනය කිරීම |
| 13 | බිම්මල් නිෂ්පාදනය |
| 14 | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය |
| 15 | ඉදිකිරීම් කටයුතු සිදු කිරීම |
| 16 | සැලසුම් ඇඳීම |
| 17 | කාර්මික උපකරණ කුළියට දීම |
| 18 | ඖෂධීය ශාක වර්ග අපනයනය කිරීම |
| 19 | එළවළු පලතුරු විජලනය කර අලෙවි කිරීම |
| 20 | ලී කැටයම් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 21 | ඉන්ධන පිරවුම්හල් |
| 22 | උත්සව අලංකරණය කිරීම |
| 23 | මෘදුකාංග නිෂ්පාදනය |
| 24 | දුරකථන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 25 | පොල්ලෙලි කැබලි කර විකිණීම |
| 26 | අමු තේ දළු එකතු කිරීම |
| 27 | සුපිරි වෙළඳසැල් |
| 28 | මූල්‍ය උපදෙස් කාර්යාල |
| 29 | සිම්පත් අලෙවි කිරීම |
| 30 | ග්‍රන්ථ ප්‍රකාශන ස්ථානයක් පවත්වාගෙන යාම |
| 31 | අනතුරුදායක ගස් ඉවත් කිරීම |
| 32 | භෝග නිෂ්පාදනය කිරීම |
| 33 | පරිසර හිතකාමී භාණ්ඩ අන්තර්ජාලය හරහා අලෙවිය |
| 34 | වීඩියෝකරණය හා නිෂ්පාදනය |
| 35 | ග්‍රොසරි |
| 36 | කැමරා උපකරණ කුළියට දීම හා අලෙවිය |
| 37 | නොදිරන කසළ එකතු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම |
| 38 | සමාගම් |
| 39 | ලිහිසි තෙල් අලෙවිය |
| 40 | ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය |
| 41 | තොග වෙළඳාම |
| 42 | පෞද්ගලික ජල විදුලි බලාගාර |
| 43 | මාර්ගගත ක්‍රමය ඔස්සේ වෙළඳාම් සිදු කිරීම හා දැන්වීම් ප්‍රචාරය |
| 44 | පෞද්ගලික රෝහල් |

**II වන උපලේඛනය**

| *I තීරුව* | *II තීරුව* |
|---|---|
| *2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම* | *රු. ශත* |
| රු. 6,000.00 නොඉක්මවන අවස්ථාවක | අයකිරීමක් නොමැත |
| රු. 6,000.00 ඉක්මවන එහෙත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවක | රු. 90.00 |
| රු. 12,000.00 ඉක්මවන නමුත් රු. 18,750.00 නොඉක්මවන විට | රු. 180.00 |
| රු. 18,750.00 ඉක්මවන නමුත් රු. 75,000.00 නොඉක්මවන විට | රු. 360.00 |
| රු. 75,000.00 ඉක්මවන නමුත් රු. 1,50,000.00 නොඉක්මවන විට | රු. 1,200.00 |
| රු. 1,50,000.00 ඉක්මවන විට | රු. 3,000.00 |

11 - 25/2

---

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, කර්මාන්ත බදු නියම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 28 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 28 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**තීරණය**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන් 2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බවට මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 150 වන වගන්තියෙන් (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බළන්ගොඩ ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත I වන උපලේඛනයෙහි නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් II වන උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් යම් විෂයාංකයක වාර්ෂික වටිනාකම මත II වන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර්ෂය සඳහා නියම විය යුතු බවට මම තීරණය කරමි.

**I වන උපලේඛනය**

| *අනු. අංකය* | *කර්මාන්තය* |
|---|---|
| 1 | ගෘහ භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 2 | දර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 3 | ලිපි ද්‍රව්‍ය, පොත්පත් නිපදවීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 4 | පුවත්පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |

| අනු. අංකය | කර්මාන්තය |
|---|---|
| 5 | රථ වාහන අමතර කොටස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 6 | ඇස් කණ්ණාඩි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 7 | ගීත පටිගත කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 8 | ඇඳුම් මැසීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 9 | බෑග් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 10 | පාවහන් නිෂ්පාදනය කිරීමේ හා අලවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 11 | පිංතූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 12 | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම. |
| 13 | කෘෂි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 14 | කොසු සහ ඉදල් නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 15 | එළවළු හා පලතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. |
| 16 | විසිතුරු පැළ හා මල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 17 | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 18 | විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 19 | නාම පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 20 | උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 21 | තේ පැළ තවන් කර අලෙවි කිරීම් ස්ථානයක් පවත්වාගෙන යාම |
| 22 | තේ කොළ පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 23 | කුළු බඩු පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 24 | බෙලි මල් පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 25 | විසිතුරු මත්ස්‍ය වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 26 | බයිට් පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 27 | රස කැවිලි පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 28 | රට කජු පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 29 | ගම්මිරිස් පැළ තවන් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 30 | හඳුන්කූරු පැකට් කිරීම හා අලෙවි කිරීම |
| 31 | විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 32 | තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම |
| 33 | කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම |
| 34 | කඩදාසි කවර නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම |
| 35 | ධාන්‍ය වර්ග පැකට් කර විකිණීම |
| 36 | ඡායා පිටපත් ලබා ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම |
| 37 | ආරක්ෂිත කැමරා පද්ධති සවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යෑම |

**II වන උපලේඛනය**

| I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 500.00 |
| රු. 750.00 ඉක්මවන එහෙත් රු. 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 |
| රු.1500.00 ඉක්මවන අවස්ථාවක | රු. 1000.00 |

11 - 25/3

---

**බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, වරිපනම් බදු නියම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 28 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බලන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 28 වැනි දින,
බලන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**තීරණය**

බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(1) වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට වරිපනම් බදු නියම කිරීම පහත සඳහන් ආකාරයට විය යුතු බව මම තීරණය කරමි. එනම්,

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ බලන්ගොඩ ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකමින් සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්,

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද බලන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල බලන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද ලබා දිය යුතු බවටත් තීරණය කරමි.

***උපලේඛනය***

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2025 මාර්තු 31 ට පෙර | 2025 ජනවාරි 31 ට පෙර |
| දෙවන කාර්තුව | 2025 ජූනි 30 ට පෙර | 2025 අප්‍රේල් 30 ට පෙර |
| තුන්වන කාර්තුව | 2025 සැප්තැම්බර් 30 ට පෙර | 2025 ජූලි 31 ට පෙර |
| හතරවන කාර්තුව | 2025 දෙසැම්බර් 31 ට පෙර | 2025 ඔක්තෝබර් 31 ට පෙර |

11 - 25/4

**බළන්ගොඩ ප්‍රාදේශීය සභාව**

2025 වර්ෂය සඳහා වාර්ෂික අක්කර බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, අක්කර බදු නියම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 28 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න,<br>ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය<br>ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,<br>බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 28 වැනි දින,<br>බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,<br>දිගදුර.

**තීරණය**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 134 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයට අදාළව සභා සීමා ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ හෙක්ටයාර එකක් මත 2025 වර්ෂය සඳහා රුපියල් දහය (10.00) ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කළ යුතු බවටත්,

තව ද, ඉහත කී පනතේ 134 වන වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අක්කර බද්ද නියම කිරීමේ හා අය කිරීමේ කාර්යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් සළකනු ලබන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක IV (ආ) වන කොටසේ හා 1989.02.03 දිනැති *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති නියමයට ඇතුළත් බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර පහකට අඩු ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ සෑම ඉඩමක් වෙනුවෙන්ම, 2025 වර්ෂය සඳහා රුපියල් පනහක් (රු.50.00) ක් බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට මම තීරණය කරමි.

තව ද, 2025 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික අක්කර බද්ද බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික අක්කර බද්ද 2025 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික අක්කර බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එකී උපලේඛනයෙ හි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ අක්කර බදු මුදල බළන්ගොඩ ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක කාර්තුවකට අදාළ මුදලින් සියයට පහක (5%) ක වට්ටමක් ද ලබා දීමට බළන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් ලබා දිය යුතු බවටත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය ප්‍රකාරව මම තීරණය කරමි.

**උපලේඛනය**

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමුවන කාර්තුව | 2025 මාර්තු 31 ට පෙර | 2025 ජනවාරි 31 ට පෙර |
| දෙවන කාර්තුව | 2025 ජුනි 30 ට පෙර | 2025 අප්‍රේල් 30 ට පෙර |
| තුන්වන කාර්තුව | 2025 සැප්තැම්බර් 30 ට පෙර | 2025 ජූලි 31 ට පෙර |
| හතරවන කාර්තුව | 2025 දෙසැම්බර් 31 ට පෙර | 2025 ඔක්තෝබර් 31 ට පෙර |

11 - 25/5

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 147 හා 148 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය, කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම බදු නියම කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 28 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න,
ලේකම් හා බලතල, කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 28 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදූර.

**තීරණය**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මම 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු 147 හා 148 වැනි වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයෙ හි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් බළන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2025 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට තීරණය කරමි. එනම්,

*උපලේඛනය*

| | | රු. ශත |
|---|---|---|
| | මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුව | 25.00 |
| | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්, කාරයක් හෝ කරත්තයක් සඳහා :- | |
| (අ) | වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) | වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| | සෑම කරත්තයක් සඳහා | 20.00 |
| | සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| | සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| | සෑම අශ්වයකු, පෝනියකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| | සෑම ඇතකු සඳහා | 50.00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් *නැතහොත්* කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත *නැතහොත්* මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.
11 - 25/6

---

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම්, ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන නිලධාරි වශයෙන්, සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම නියම කිරීම සම්බන්ධයෙන් පහත

සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 28 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න,
ලේකම් හා බලතල, කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව.

2024 අගෝස්තු මස 28 වැනි දින,
බළන්ගොඩ ප්‍රාදේශීය සභාව,
දිගදුර.

**තීරණය**

බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටු කරන, බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් ජී. කේ. ආර්. එන්. ප්‍රේමරත්න වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153 වගන්තියෙ හි විධිවිධාන ප්‍රකාරව බළන්ගොඩ ප්‍රාදේශීය සභා සීමා තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් (2%) වන බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) (ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩමේ ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 5:1 විය යුතු බවටත්, තීරණය කරමි.

11 - 25/7

---

## බළන්ගොඩ ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම

